# වට්ටක ජාතකය

තවද එක්සමයෙක්හි සද්ධර්ම කෙතුක වූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ මගධරට සැරිසරා ඇවිදිනාසේක් ලැවුගිනි නිවීමක් අරභයා මේ ජාතකය වදාළ සේක.

එක්සමයෙක්හි සර්වඥයන් වහන්සේ මගධරට සැරිසරා ඇවිදිනාසේක් එක්තරා මගධ ග්‍රාමයක පිඬුසිඟා ඇවිද වළඳා ඉක්බිති භික්ෂු සමූහයා පිරිවරා මගට පිළිපන් සේක. එසමයෙහි මහත් වූ ලැවුගින්නෙක් නැංගේය. ඉදිරියෙහිත් පස්සෙහිත් බොහෝ භික්ෂූහුය. ඒ ලැව්ගිනි එකධූමව එකජවාලව මැඩගෙණ එන්නේය. එතැන්හි සමහර පෘථජ්ජන භික්ෂූකෙනෙකුන් වහන්සේ මරණ භයින් භයපත්ව මේ එන ගින්නට අපි ඉදිරියෙහි ගිනිලම්භ මේ ගින්නෙන් දාගියතැන් ලැව්ගිනි නො දවන්නේ යයි කියා ගිනිදඬු මැත් කොට ගිනිගානසේක. ඒ දැක සමහර භික්ෂූ කෙණෙකුන් වහන්සේ මෙසේ කී සේක. ඇවැත්නී. තෙපි කුමක් කරව්ද ආකාශ මධ්‍යයෙහි සිට චන්ද්‍රමණ්ඩලයත් නැගෙණහිරිසක්වළින් නැගෙන්නාවූ දහසක් රස්මීන් හෙබියා වූ සූර්ය මණ්ඩලයත් වෙලාන්තරයෙහි සිට සමුද්‍රයත් මහමෙර සමීපයෙහි සිට මහමෙරත් නොදත්තවුමෙන් දෙව්මිනිස් සහිත වූ ලොවට අග්‍රපුද්ගල වූ තොප හා සමග යන්නාවූ සම්‍යක් සම්බුදුරජානන් වහන්සේ නො බලා පටග්ගිදානය දෙම්හයි කියව බුදුබල නොදනුව වර තොපි බුදුන් සමීපයට යම්හයි කියා ඉදිරියෙහිත් යන්නාවූ ඒ සියලු භික්ෂූන් වහන්සේම එක්ව දශබලධාරී වූ බුදුරජානන් වහන්සේ සමීපයට ගියසේක. සර්වඥයන් වහන්සේ මහත් වූ භික්ෂූසංඝයා පිරිවරා එක්තරා ප්‍රදේශයක වැඩසිටිසේක. එකල ලැවුගිනි මඩනාක් මෙන් බුරමින් එන්නේය. මෙසේ එන්නා වූ ලැව්ගිනි බුදුන් සිටි තැනට පැමිණ ඒ ප්‍රදේශයට හාත්පසින් සොළොකිරියක් පමණ තැනට පැමිණ දියෙහි ගලා නිවාපු තණ සුලක්මෙන් නිවිගියේය. එකල්හි භික්ෂූන් වහන්සේ බුදුන්ගේ ගුණ කියන්නට පටන් ගත්සේක. මේ සිත් පිත් නැති ගිනිපවා බුදුන් සිටි තැන් මැඩගෙන එන්ට අසමර්ථ විය දියෙහි ගලාපු තණ සුලක්මෙන් නිවිගියේය. සර්වඥවරයන්ගේ ආනුභාව නම් ඉතා ආශ්චර්යයි මෙසේ බුදුගුණ කියන්ට පටන්ගත් සේක.සර්වඥයන් වහන්සේගේ ගුණ නම් ඉතා ආශ්චර්යය සේක නොදතහැක්කේය. මේ සිත් පිත් නැති ගිනිපවා බුදුන් සිටි තැන් මැඩගෙණ එන්ට අසමර්ථි වීය. දියෙහි ගලාපු තණ සුලක්මෙන් නිවිගියේය. සර්වඥවරයන්ගේ ආනුභාව නම් ඉතා ආශ්චර්යයි මෙසේ බුදුගුණ කියන්ට පටන් ගත්සේක. සර්වඥයන් වහන්සේ ඒ භික්ෂූන්ගේ කථාව අසා මහණෙනි මේ මාගේ දැන් මල නොවෙයි මේ භූමිප්‍රදේශයට පැමිණ මේ ගිනි නිවියේ නම් මේ වූකලි මාගේ පුරාතනයෙහි සත්‍යක්‍රියා බලවන්නේය. මේ ප්‍රදේශය ප්‍රාතිහාර්යයයෙක් වන්නේයයි වදාළසේක. එකල්හි ආයුෂ්මත් වූ ආනන්ද මහා තෙරුන් වහන්සේ බුදුන් වැඩහිඳිනා පිණිස සඟලසිවුර සතරපට කොට පැණ වූසේක. එහි සර්වඥයන් වහන්සේ පලක් බැඳ වැඩහුන් සේක. භික්ෂූසංඝයා වහන්සේත් බුදුන් පිරිවරා වැඩහුන්සේක. එකල්හි සර්වඥයන් වහන්සේ භික්ෂූන් විසින් ස්වාමීනි මේ වුකලි අපට ප්‍රකාශය අතීත කථාව භවයෙන් පටිච්ඡන්න හෙයින් අප්‍රකාශය ඒ අතීත කථාව අපට ප්‍රකාශ කොට වදාළමැනවැයි භික්ෂූන් විසින් ආරාධිත වූ බුදුහු ඉකුත්වත් දක්වා වදාළ සේක.

යටගිය දවස මගධරට එම ප්‍රදේශයෙහි බෝධිසත්වයෝ වටුයෝනියෙහි පිළිසිඳගෙණ මව්කුසින් බිහිව බිජුවට ගසාගෙණ නික්මුණු කල්හි මහත් වූ පෙදවටසා පමණ වටු පැටවෙක් වූයේය. ඉක්බිත්තෙන් ඔහු දෙමව්පියෝ කැදැල්ලේ වැදහොවා මුවතුඩින් ගොදුරු ගෙණවුත් පෝෂ්‍ය කෙරෙති. ඒ බෝධිසත්වයන්ට පක්ෂප්‍රහාර කොට ආකාශයෙන් යන්ට නිසිබලයෙක්වත් දෙපස ඔසවා ගොඩ ගමන් කරන්ට බලයෙක්වත් නැත. ඒ ප්‍රදේශය ද අවුරුද්දක් අවුරුද්දක් පාසා ලැවුගිනි ගන්නේය. ඒ ලැව්ගිනි එසමයෙහිත් මහහඬින් බුරමින් ඒ ප්‍රදේශයෙහි ගිනි ගත්තේ. ඒ දැක පක්ෂිය සමූහයා තම තමන්ගේ කැදැල්ලෙන් නික්ම මරණ භයින් භයපත්ව හඬමින් යන්නාහුය. බෝධිසත්වයන්ගේ දෙමව්පියෝ මරණ භයින් භයපත්ව බෝධිසත්වයන් හැර පියා පලාගියාහුය. බෝධිසත්වයෝ කැදැල්ලේ වැදහෙවම කර ඔසමා මැඩගෙණ එන්නා වූ ලැව්ගිනි දැක මෙසේ සිතූය. ඉදින් මට පක්ෂප්‍රහාර කොට ආකාශයෙන් යන්ට කිසි බලයෙක් වේනම් ආකාශයට පැනනැගී අනික් තැනකටයෙමි, මාගේ දෙමව්පියෝත් මරණභයින් භයපත්ව මා උදකලා කොට හැර තමන් රැකෙමින් ගියෝය. දැන් මට අන් පිළිසරණෙක් නැත. සරණයක් පිහිටක් නැත්තේම් මා විසින් අද කුමක් කටයුතුදෝහෝයි සිතූහ. තවද බෝධිසත්වයන්ට එකල මෙසේ වූ සිතිවිල්ලක් වුයේය. මේ ලෝකයෙහි ශීලගුණ නම් වූ දෙයක් ඇත. සත්‍යගුණ නම් වූ දෙයක් ඇත. යටගිය දවස පාරමීධර්මයන් පුරා බෝමැඩ හිඳ සම්‍යක් සම්බෝධිඥාන සමධිගමනය කළා වූ ශීලසමාධි ප්‍රඥාවිමුක්තිඥාන දර්ශනයෙන් යුක්ත වූ සියල්ලන් කෙරෙහි පතළා වූ මෛත්‍රී කරුණා ක්‍ෂාන්තියෙන් යුක්ත වූ සියලු සත්වයන් කෙරෙහි සමව පැවැත්තාවූ මෛත්‍රී භාවනාව ඇති සර්වඥවරයෝ නම් ඇත ඔවුන් විසින් ප්‍රතිවෙධකරණ ලද ධර්ම ගුණ නම් දෙයක් ඇත. මා කෙරෙහිත් එක් සත්‍යයක් ඇත. එසේ හෙයින් අතීතයෙහි උපන්නා වූ සර්වඥවරයන් හා ඔවුන් විසින් ප්‍රතිවේධකරණ ලද ගුණධර්මය ආවර්ජනය කොට මා කෙරෙහි විද්‍යාමාන වූ සත්‍ය සත්‍යක්‍රියා කොට ගිනිවළකා අද මා විසින් මටත් සෙසු පක්ෂීන්ටත් ස්වාස්ථ්‍යයක් කිරීම වටනේයයි සිතූය. ඉක්බිත්තෙන් බෝධිසත්වයෝ අතීතයෙහි පිරිනිවියා වූ සර්වඥයන් වහන්සේගේ ගුණ සලකා තමන් කෙරෙහි විද්‍යාමාන වූ සත්‍යස්වභාවය උදෙසා සත්‍යක්‍රියා කරන්නාහු මෙසේ කිවුය. ඉදින් මාගේ පක්ෂපාත්‍රයන් විදා ආකාශයෙහි නොයාහැකි බවත් හස්තපාදයන් ඇති බවත් ඔසවා නොයාහැකි බවත් දෙමව්පියන් මා කැදැල්ලේම දමා ගිය බවත් සත්‍යයද ඒ සත්‍යයෙන් ජාතවෙදය ඉවත්ව යායි කියා කැදැල්ලෙහි වැද හෙව සත්‍ය ක්‍රියා කළෝය. ඒ බෝධිසත්වයන්ගේ සත්‍ය ක්‍රියා හා සමග සොළොස් කිරීයක් පමණ තැන් නිවි ගිනි ඉවත්ව ගියෝය. ගිනි පසුබස්නේත් දවාගෙණ වනයට නොගියේය. වැලි කුමක් කළෝදයත් දියෙහි ගලාපු තණසුලක් මෙන් එතැන්හිම නිවී ගියේය. ඒ

මහාබෝධිසත්වයන් විසූ වාසස්ථානය මේ පියලුම කපමුලුල්ලෙහි ගින්නක් වැද නොගන්නා බැවින් කල්පස්ථායි වූ ප්‍රාතිහාර්යය නම් විය. මෙසේ මහබෝසතානෝ සත්‍යක්‍රියා කොට ජීවිතාන්තයෙහි කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියේය. ශාස්තෘ වූ බුදුරජානන් වහන්සේ මහණෙනි, මේ වනය ගින්නෙන් නොදැයේ දැන් මාගේ බලයෙක් නොවෙයි පුරාතනයෙහි වටුව උපන්කල මාගේ සත්‍යක්‍රියා බලයෙකැයි මේ ධර්මදේශනාව ගෙණ හැර දක්වා වදාරා චතුස්සත්‍ය ප්‍රකාශ කළසේක. චතුස්සත්‍යායාගේ කෙළවර සමහර කෙණෙකුන් වහන්සේ සෝවාන් වු සේක. සමහර කෙණෙකුන් වහන්සේ සකෘදාගාමී වූසේක. සමහර කෙණෙකුන් වහන්සේ අනාගාමී වූසේක. සමහර කෙණෙකුන් වහන්සේ රහත් වූසේක. බුදුරජානන් වහන්සේ  පූර්වාපර සන්ධි ගලපා මේ වට්ටක ජාතකය නිමවා වදාල සේක. එසමයෙහි දෙමව්පියෝ නම් දැන් මේ දෙමව්පියෝමය. එසමයෙහි වටු රජ්ජුරුවෝ නම් තිලෝගුරු සම්‍යක් සම්බුදු රජ වූ මම් ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළ සේකි.